මෛත්‍රීපාල සිරිසේන විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙසින් ජනාධිපතිවරණයට තරඟ කරමින් ජනතාව ඉදිරියේ කියා සිටියේ මහින්ද රාජපක්ෂ රට තුළ ගොඩ නැගූ අශිෂ්ඨ මජර දේශපාලන සංස්කෘතිය වෙනස් කොට යහපාලනයක් ගොඩනගන බවය. එහෙත් ඔහු ජනාධිපති ධුරයට පත්වීමෙන් පසුව ඒ පිළිබඳ කතාව යටපත්ව ගියේය. ඉන් පසුව ඔහු කතා කරන්නට පටන් ගත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනගන ආකාරය පිළිබඳවය. ක්‍රියා කළේද ඒ සඳහාය. මාර්තු මාසයේ පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණයේදී තමන් ශ්‍රීලනිපයේ ජයග්‍රහණයට නායකත්වය දෙන බව ජනාධිපතිවරයා කියා සිටින්නේ ප්‍රසිද්ධියේමය.පසුව පියවරෙන් පියවර ඊට තවත් කාරණා එක්කෙරුණු අතර දැන් ජනාධිපතිවරයා මුල්තැනදී කටයුතු කරන්නේද ඔහුගේ ඒ න්‍යාය පත්‍රයට අනුව මිස ජනවාරි 8වෙනිදා ජනතාවට දුන් පොරොන්දු ඉටු කිරීමට නොවන බව පැහැදිලිය.

ගතවූ මාස දහයක කාලය තුළ රටේ කිසියම් සාධනීය දේශපාලන වෙනසක් සිදුවූවානම් සිදුවූයේ

කළේ ජල-කඳුළු ගෑස් සහ පා පහර පමණක් වුවද මෙවර මෛත්‍රී-රනිල් යහපාලන පොලිසිය ඒ සියල්ලත් සමඟ පන්න පන්නා බැටන් ප්‍රහාරද එල්ල කරමින් සිසුන්ගේ ඔළු පැලුවේය. ආරක්ෂිත හිස්වැසුම් පැළඳ පොලු අතට ගෙන සිටි පොලිස් ප්‍රහාරයකයෝ සිසුන් බිම හෙළා පා පහර දුන්නා පමණක් නොව බිම වැටී සිටි සිසුවියන්ටද රෝහල් ගතවෙන්නටම ප්‍රහාර එල්ල කළහ. අවසානයේ සිසුන් ගණනාවක් රෝහල් ගත කෙරුණු අතර 39 දෙනෙකු පොලිස් අත්අඩංගුවට ගෙන නඩු පවරනු ලැබූහ.

මහා මාර්ග සහ උසස් අධ්‍යාපන ඇමැති ලක්ෂ්මන් කිරිඇල්ල මාධ්‍යටය ප්‍රකාශ කළේ සිසුන්ට මෙවැනි විරෝධතාවක් දැක්වීමට අවශ්‍යතාවක් නොතිබූ බවය. පොලිසිය මාධ්‍ය සාකච්ඡාවක් කැඳවා ප්‍රකාශ කළේ මාධ්‍ය සිද්ධිය වැරදි ලෙස වාර්තා කළ බවත් පොලිසිය සිසුන්ට පහර නොදුන් බවත්, වැටී සිටි සිසුන් නැගිට්ට වූ බවත්ය. මේ මාධ්‍ය හමුවට වත්මන් පොලිස් ප්‍රකාශක රුවන් ගුණසේකර පමණක් නොව මහින්ද රාජපක්ෂගේ පොලිස් ප්‍රකාශක අජිත් රෝහණද එක්ව සිටීම හාස්‍යද ජුගුප්සාවද එකවිට ජනිත කරවූ දසුනක් විය.




# මෛත්‍රී-රනිල් යහපාලනයේ රතු සංඥාව

තවදුරටත් කෙරුණු ජනතා මැදිහත්වීම් නිසා මිස ජනාධිපතිවරයාට ඒ පිළිබඳ තිබූ අවංක වුවමනාවක් නිසා නොවේ. ආචාර්ය ශිරාණි බණ්ඩාරනායක අගවිනිසුරු ධුරයෙන් පලවා හැර මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා එම තනතුරට පත් කළ කුප්‍රකට අගවිනිසුරු මොහාන් පීරිස් ධුරයෙන් ඉවත් කරවා ගැනීමට ජනතාවට පාරට බසින්නට සිදුවිය. ජනාධිපතිවරයා නායකත්වය දෙන පක්ෂය සහ සන්ධානය විසින්ම දියාරු කළ 19 වෙනි ව්‍යවස්ථාව සම්මත කරගැනීමට ජනතාවට පාරට බසින්නට සිදුවිය. අනෙකක් තබා රාජපක්ෂ පවුලේ අවශ්‍යතාව මත සිදුවූ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ ඝාතනය පිළිබඳ අත්අඩංගුවට ගත් සැකකරුවන් රඳවා තබාගැනීමේ නියෝගයක් ලබාගන්නට, ඇවන්ගාඩ් අවි ගනුදෙනු පරීක්ෂණ ඉදිරියට ගෙනයාමට ආදී සරළ කටයුතු කරගැනීමට පවා ජනතාවට පාරට බසින්නට සිදුවිය.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවීමෙන් සහ රනිල් වික්‍රමසිංහ අගමැතිවීමෙන් පසු රටේ ඇතිවූ සාධනීය දේශපාලන වෙනස එලෙස වීදි බසින්නට ජනතාවට අවකාශයක් හිමිවීමය. දැන් ඒ අවකාශයද හැකිළීම ඇරඹී ඇත. ජනතාව පාරට බැසීමෙන් සිදු කරගැනීමට හැකිවූ ඒ සීමිත කටයුතු හැරුණු විට ජනාධිපතිවරයාට කළ හැකිව ඇති,

ඔවුහු එහිදී මාධ්‍යයටද අවවාද සංඥාවක් නිකුත් කරමින් කියා සිටියේ ''ඔයගොල්ලෝ එහෙම නම් අපිත් මෙහෙම තමයි'' කියාය. බොහෝ පාර්ශ්වයන් වෙතින් මේ පොලිස් ප්‍රහාරය දැඩිව හෙළා දකිමින් සිටියදී ආණ්ඩුවද පොලිසියද එය සාධාරණීකරණය කළේ එසේය.

මේ පොලිස් ප්‍රහාරය අහම්බයක් නොව ''යහපාලන'' ආණ්ඩුව ජනතාවට සිය ගමන් මාර්ගය පිළිබඳ දක්වන ලද සංඥාවක් ලෙස සැළකීම වඩාත් සුදුසුය. යහපාලනයක් ගැන කතා කරමින් ජනවාරි 8 වෙනිදා ජනතා බලාපොරොත්තුව මතින් බලයට පත් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මෙන්ම ඔහුගේ නායකත්වයෙන් බිහි කළ දින 100 ආණ්ඩුවද, ඉන් පසුව බිහි කළ වත්මන් හයිබ්‍රිඩ් ආණ්ඩුවද කටයුතු කරමින් සිටින්නේ ජනවාරි 8 ජනතා ප්‍රාර්ථනා ඉෂ්ට කිරීමේ අවංක වුවමනාවකින් නොවන බවත්, පටු පක්ෂ දේශපාලන වුවමනා වෙනුවෙන් බවත් මේ වන අවශ්‍ය ප්‍රමාණයටත් වැඩියෙන් ඔප්පු කොට හමාරය.

ආණ්ඩුවේ ඉදිරි සැළසුම සකස් වෙමින් තිබෙන්නේද ඒ මාවතේම තවදුරටත් ඉදිරියට යාමට බව එය කටයුතු කරගෙන යන ආකාරයෙන් පැහැදිලි වෙමින් පවතී. මේ වන විට ඉදිකිරීම් නතර කොට

**මහින්ද රාජක්ෂ පාලනය විසින් ගොඩනඟා නඩත්තු කළ අශිෂ්ඨ මජර දේශපාලන සංස්කෘතිය විසින් ගිල නොගත් එකම රාජ්‍ය ආයතනයක් හෝ රට තුළ නොමැත. පොලිසිය ඒ අතර ඉහළම තැනක් හිමිකරගන්නා ආයතනයකි.**

එහෙත් නොකළ, තවදුරටත් පැහැර හරිමින් සිටින කටයුතු ප්‍රමාණය බෙහෙවින් විශාලය. ඒවායින් යම් ප්‍රමාණයක් හෝ ඉටු කරගැනීමටත් ඉදිරියේදී ජනතාවට පාරට බසින්නට සිදුවනු නොඅනුමානය.

පසුගිය බ්‍රහස්පතින්දා HNDA සිසුහු පාරට බැස්සේ එවැනි වෙනසක් සිදුකරගැනීමට ආණ්ඩුවේ අවධානය යොමුකරවා ගැනීමටය. ඔවුන්ගේ ප්‍රකාශ අනුව ඔවුන්ගේ ඉල්ලීම වී තිබුණේ උපාධි පාඨමාලාවක්ව තිබී මහින්ද රාපක්ෂ පාලන කාලයේදී ඒ තත්ත්වයෙන් පහළට දමන ලද සිය පාඨමාලාව නැවත උපාධි පාඨමාලාවක් තත්ත්වයට පත් කරගැනීමය. ඒ සඳහා රාජපක්ෂ පාලන කාලයේදීද ඔවුන් මේ ආකාරයෙන් විරෝධතා ව්‍යාපාර සිදුකොට තිබිණ. එහිදී රාජපක්ෂගේ පොලිසිය ඔවුනට ජල සහ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කොට විසුරුවා හැර තිබිණ. ඒ ඉල්ලීම රැගෙන මෛත්‍රීපාල සිරිසේන -රනිල් වික්‍රමසිංහ යහපාලන ආණ්ඩුව කාලයේද සිසුනට නැවත පාරට බහින්නට සිදුවන්නේ යහපාලනය ඇතිවී දස මසක් ගෙවී ගිය තැන පවා යහපාලකයන්ගෙන්ද ඒ කටයුත්ත ඉටුවී නොතිබූ බැවිනි. එසේ පාරට බැස්ස සිසුන්ට මුහුණ දෙන්නට සිදුවූයේ මහින්ද රාජපක්ෂ පාලනය එල්ල කළාට වඩා දරුණු පොලිස් ප්‍රහාරයකටය.

මහින්ද රාජපක්ෂ පොලිසිය එදා සිසුන්ට එල්ල

ඇති කොළඹ වරාය නගරය ඉදිකිරීම් නැවත ඇරඹීමට පිඹුරුපත් සැකසෙමින් පවතී. කම්කරු අයිතිවාසිකම් කප්පාදු කෙරෙන ආකාරයේ කම්කරු නීති සංශෝධනයක් යෝජනා වී තිබේ. ඒ අතර ජනවාරි 8 ජනවරම පිළිබඳ ආණ්ඩුව කිසිදු සැලකිල්ලක් නොදක්වයි. ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීම පිළිබඳ, විධායක ජනාධිපති ධුරය අහෝසි කෙරෙන නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳව, මැතිවරණ ක්‍රමය සංශෝධනය ගැන දැන් ආණ්ඩුව පැත්තෙන් කිසිදු හඬක් නොනැගේ. බේදවාචකය නම් ආණ්ඩුව අවධානය යොමු කළ යුතු දේවල් පිළිබඳ දැන් අවධානය යොමු කරමින් සිටින්නේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා සහ ඔහු වටේ සිටින විමල්ලා වාසුලා දිනේෂ්ලා වීමය.

ආණ්ඩුව ගමන් කරන දිශානතිය අනුව ඉදිරියේදී තව බොහෝ ජනතා උද්ඝෝෂණ ඇතිවිය හැකිය. හැට දෙලක්ෂයක ජනතාවක් යහපත් දේශපාලන අරමුණක් වෙනුවෙන් එලෙස පාරට බසින විට වෙනස් දේශපාලන අරමුණක් වෙනුවෙන් වුවද 58 ලක්ෂයෙන් සැළකිය යුතු ජනතාවක් ද ඊට එකතුවීම වැළැක්විය නොහැකිය. එවිට ආණ්ඩුවට ජනතා ඉල්ලීම් ඉටු කරන්නට සිදුවනු ඇත. ඒ ක්‍රමයට රට ඉදිරියට ගියහොත් තම පටු

දේශපාලන න්‍යාය පත්‍ර හැකිළෙන බව මෛත්‍රීපාල මෙන්ම රනිල් ද දනිති. මහින්දට මෙන්ම ඒ තත්ත්වය වළක්වා ගැනීමට මේ දෙදෙනාටත් අවශ්‍ය බව නොකිවයුතුය. එය කළ හැකි එකම ක්‍රමය මර්ධනය පමණි. යහ් එල්ල කළ පොලිස් ප්‍රහාරය එහි ප්‍රථම සංඥාව ලෙස සැළකිය හැක්කේ එබැවිනි.

ආණ්ඩුව මේ ආකාරයෙන් පොලිසිය පාවිච්චි කිරීම සිවිල් ජනතාවගේ මූලික අයිතිවාසිකම් විෂයෙහි ඇති කරනු ලබන බලපෑම අතිශය විනාශකාරීය. පොලිසිය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ සිදුවන අපරාධ පරීක්ෂණ ක්‍රියාවලිය රටේ අපරාධ පාලනයට හේතුවන්නක්ද නොඑසේව රටේ අපරාධ ඉහළ යාමට හේතුවන්නක්ද යන්න පිළිබඳ බරපතල සැක මතු කෙරෙන සිදුවීම් වාර්තා වන්නට පටන්ගෙන දැන් කාලයක් ඉක්ම ගොසිනි. එහෙත් ඒ පිළිබඳ දැනුම්වත් පුරවැසි සමාජයේ පවා සංවාදයක් ගොඩනැගී නොමැත. පොලිසිය නීතිය අවනීතිය කිරීමට එරෙහිව තැනින් තැන පලින් පල මතුවෙන හුදකලා විරෝධතා දක්නට ලැබුණද ඒ පිළිබඳ වගකිව යුතු අංශවල අවධානයක් යොමුවන බවක් පෙනෙන්නට ද නැත. ජනවාරි 8වෙනිදා රටේ සිදුවූ දේශපාලන වෙනසින් පසුව පවා පාර්ලිමේන්තුව, අධිකරණය, නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය වීමේ අවශ්‍යතාව පිළිබඳ සමාජයේ ඇතිවූ කතිකාව පොලිසිය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් ඇති වූයේ නැත. එහි ප්‍රතිපලයක් ලෙස අදටත් පොලිසිය ක්‍රියාත්මක වෙන්නේ මහින්ද රාජපක්ෂ පාලන කාලයේදී ක්‍රියාත්මක වූවාක් මෙන්ම අන්ත දූෂිත සහ මර්ධනකාරී ආයතනයක් ලෙසටය. පොලිස්පතිවරයාගේ සිට පොලිස් ස්ථානාධිපතිවරයා දක්වාම අදටත් පොලිසියේ පරිපාලන නිලතල දරන්නේ මහින්ද රාජපක්ෂ පාලනය විසින් දේශපාලන අවශ්‍යතාව මත උසස්වීම් දෙමින් එම නිලවලට පත්කරනු ලැබූ නිලධාරින්මය.

මහින්ද රාජක්ෂ පාලනය විසින් ගොඩනඟා නඩත්තු කළ අශිෂ්ඨ මජර දේශපාලන සංස්කෘතිය විසින් ගිල නොගත් එකම රාජ්‍ය ආයතනයක් හෝ රට තුළ නොමැත. පොලිසිය ඒ අතර ඉහළම තැනක් හිමිකරගන්නා ආයතනයකි. 17 වෙනි සංශෝධනය යටතේ පොලිස් කොමිසම මගින් කළ යුතු කටයුතු මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් පවරාදී තිබුණේ ඔහුගේ සහෝදරයාටය. සහෝදරයා පොලිසියේ ස්වාධීනත්ව කොඳු නාරටිය බිඳ දමා එයට ඉරට්ටක් සවි කළේය. පොලිස්පතිවරයාගේ සිට පොලිස් ස්ථානාධිපතිවරයා



ශ්‍රීලාල් සෙනෙවිරත්න

දක්වා සියලු පත් කිරීම් සිදුකරන ලද්දේ දේශපාලන අවශ්‍යතාව සැළකිල්ලට ගෙනය. මේ පිළිවෙත හේතුවෙන් ඉහළ වෘත්තීය ගුණයෙන් හෙබි දක්ෂ පොලිස් නිලධාරින් දෙපාර්තමේන්තුවේ අහු මුළුවලට තල්ලු කෙරුණු අතර දේශපාලන හෙන්චයියන්වීමට කැමති නිලධාරින්ට පොලිසියේ ඉදිරිපෙළ අසුන්ද, කඩිනම් උසස්වීම්ද, සේවා දිගු කිරීම්ද විශ්‍රාම ගිය පසු විදෙස් තානාපති ධුරද ලැබුණි. මේ ආකාරයෙන් පොලිස් දෙපාර්තමේන්තුව අරක්ගෙන සිටින දූෂිත නිලධාරින් ඉවත් කොට සුදුසුකම් සහිත ගෞරවනීය වෘත්තීය අතීතයක් හිමි පිරිසකට පොලිසිය බාර දෙන්නට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු කටයුතු කළේ නැත. මහින්ද රාජපක්ෂගේ පොලිස් ප්‍රකාශක අජිත් රෝහණ පවා එම තනතුරෙන් ඉවත් කෙරුණේ සැළකිය යුතු කාලයක් ගතවූවාට පසුවය.

මෙවැනි පොලිසියක් යොදාගෙන මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා හෝ අගමැති රනිල් වික්‍රමසිංහ සිය පටු දේශපාලන න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයන්නට උත්සාහ කරන්නේ නම් ඉදිරියේදී යහපත් දේශපාලන සංස්කෘතියක් වෙනුවෙන් ජනවාරි 8 වෙනිදා මහත් කැපකිරීමක් කළ, තවදුරටත් ඒ වෙනුවෙන් පෙනී සිටින ජනතාවගෙන් සැළකිය යුතු පිරිසකට ඉදිරියේදී උසාවි ගානේ රස්තියාදුවීමටත්, සිරගෙවල්වල තපින්නටත් සිදුවනු ඇත. ඒ බව අවබෝධ කර ගැනීමට කොටදෙණියාවේ දුනේෂ් ප්‍රියශාන්ත (කොණ්ඩයා) ගේ සිදුවීම පමණක් වුවද ප්‍රමාණවත්ය.

**(එය අන් තැනෙක පලවේ.)**